ගම්පහ අධ්‍යාපන කලාපය

05 ශ්‍රේණිය - මව්බස

කාර්ය පත්‍රිකා අංක 03

**කාලය- පැය 01**

නම-------------------------------------------------------------------------

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**01)මිශ්‍ර සිංහල හෝඩිය ඇසුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01.මිශ්‍ර සිංහල හෝඩියේ ඇති අක්ෂර ගණන 1) 58 කි 2) 60 කි 3) 56 කි

02.එහි ස්වර අක්ෂර කීයක් තිබේ ද ? 1) 20 කි 2) 40 කි 3) 18 කි

03).එහි ව්‍යඤ්ජන අක්ෂර කීයක් තිබේ ද ? 1) 40 කි 2) 42 කි 3) 20 කි

04).මිශ්‍ර සිංහල හෝඩියේ ඇති මධ්‍ය අක්ෂර දෙකකි, 1) ඓ ,ණ 2) ඖ , ෆ 3) අං , අඃ

05).එහි ඇති අවරෝහණ අක්ෂර දෙකකි. 1) අ ,ද 2) ල ,එ 3) ඬ ,ඇ

(ල. 1×5 =05))

**02)පහත සඳහන් වාක්‍යවලට සුදුසු විරාම ලකුණු යොදන්න.**

1) පුතේ මෙහාට එන්න යැයි තාත්තා කිවුවේය
2) ඇත් අස් රිය පා බල යනු දුටුගැමුණු රජුගේ චතුරංගනී සේනාව ය
3) ඕකට ඉතිං මේ හදිස්සියෙ ම යන්න පුළුවනි ද
4) ඇයගේ කැපවීම පුදුමාකාර ය (ල. 1×10 =10)

**03)පහත දැක්වෙන අකුරුවල අඩංගු පිල්ලම තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 1. සා | කෙටි පාපිල්ල |
| 2. සැ | දික් ඇදපිල්ල |
| 3. සෑ | කොම්බුව |
| 4. සි | දික් පාපිල්ල |
| 5. සී | කොම්බුව , ඇලපිල්ල |
| 6. සු | ඇලපිල්ල |
| 7. සූ | ඉස්පිල්ල |
| 8. සෙ | කොම්බුව , හල් කිරීම |
| 9. සේ | කෙටි ඇදපිල්ල |
| 10. සො | දික් ඉස්පිල්ල |

(ල. 1×10 =10)

**04)හිස්තැනට සුදුසු නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත අකුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. වි_____ල (සා ,ශා , ෂා)
2. පරිග______ක ( න ,ණ )
3. සාකච්______ ( චා ,ඡා ,ජා
4. කෘත_______ ( ඥ , ඤ )
5. රාජ_______නිය ( දා ,ධා )
6. ගැහැ______ය ( ණි , නි )
7. කොට්ඨා______ය (ස ,ශ , ෂ )
8. ප්‍ර______සංස්කරණ ( ථි ,ති )
9. කාර්යක්______ම ( ස , ෂ , ශ )
10. පො______ව ( ලො , ළො )
11. සමෘද්______මත් (දි , ධි )
12. අධ______පන (යා ,්‍යා)

ගම්පහ අධ්‍යාපන කලාපය

13.ගං______ව (ගා ,හ)

14.ජෝෂ්______( ය , ට , ඨ )

15.______රවයෙන් (ගවු ,ගෞ ,ගෟ ) (ල. 1×15 =15)

**05)ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ඉදිරියෙන් ලියන්න.**

( කුරුල්ලන් , සිතුවම , කිව්වා ය , ළමයි , පිපෙයි )

1. අප්‍රාණවාචී ඒකවචන නාමපදයකි. - ------------------------------------
2. ඉබේ සිදුවන ක්‍රියා පදයකි. - ----------------------------------
3. ප්‍රාණවාචී බහුවචන නාමපදයකි. - ----------------------------------
4. බහුවචන අනුක්ත පදයකි. - ----------------------------------
5. ස්ත්‍රීලිංග ඒකවචන ක්‍රියාපදයකි. - ------------------------------------ (ල. 1×5 =05)

**06)පහත දැක්වෙන වචනවල යටින් ඉරි ඇඳි අකුරේ පිල්ලමට අදාළ ශබ්දය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

1. පාන්දර - -----------------------------------
2. සවස - -----------------------------------
3. කෞතුක - -----------------------------------
4. සීගිරිය - -------------------------------------
5. වෙහෙස- ------------------------------------
6. දැනුම- -----------------------------------
7. වෛද්‍යවරයා - ------------------------------------
8. ගෝලාකාර - ------------------------------------
9. කෑම - -----------------------------
10. සෞභාග්‍යය - -------------------------------
11. කුඩය - --------------------------
12.වේවැල් - ------------------------------
13. ගිරවා- ---------------------------
14. බොහොම - ------------------------------
15. රුපියල - ----------------------------

(ල. 1×15 =15)

**07)සුදුසු වර්තමාන කාල ක්‍රියා පදය යොදා හිස් තැන් සම්පූර්ණ කරන්න.**

1. මම මගේ රටට ආදරය----------------------------
2. අපි සෞභාග්‍ය සම්පන්නව ජීවත්------------------------------------
3. අම්මා ආහාර පිළියෙල----------------------------------
4. මලිත්,ශනෙත් සහ පසන් ගුවන්විදුලියට සවන්----------------------------------
5. ගුරුවරු හොඳින් පාඩම්-------------------------------
6. ඔවුහු අසරණයන්ට පිහිට-------------------------------------
7. සිංහ ධේනුව ගල් ගුහාවේ-------------------------------------
8. වඩුවා පුටුව ----------------------------------
9. අඹ ගෙඩියක් ඉදී------------------------------
10. ගස් සුළඟට----------------------

(ල. 1×10 =10)

**08)වාක්‍ය නිවැරදි ව සකස් කර ලියන්න.**

1. කියවමි/ කතන්දර/ මම/ පොතක්--------------------------------------------------------------------
2. අපි/සෙල්ලම්/කරමු/සමගියෙන් ---------------------------------------------------------------------
3. ඉදුණු/ ලේනා/ අඹ / කඩයි-------------------------------------------------------------------------------
4. නැන්දා /කෑමක් /හදයි /රසවත්---------------------------------------------------------------------------
5. පිල් /මොනරා /නැටුවේය/විදහා / නැටුමක්-----------------------------------------------------------

(ල. 2×5 =10)

**09)පහත දැක්වෙන නිවේදනය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

| |
|---|
| විද්‍යාලයීය දූ පුතුන්ගේ කලා කුසලතා එළි දක්වන 'රඟන රැඟුම්' විවිධ ප්‍රසංගය මෙවරත් උත්කර්ෂවත් අයුරින් 2020 දෙසැම්බර් මස 05 වන දින ප.ව. 2.00ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.පාසැලේ සියලු ම ශිෂ්‍යාශිෂ්‍යාවන්ගේ සහභාගිත්වයෙන් විවිධ ප්‍රසංගය හැඩ ගැන්වීමට නියමිතය.එය නැරඹීම සදහා සියලුම දෙමව්පියන්ට සහ ආදි ශිෂ්‍යාශිෂ්‍යාවන්ට ඇරයුම් කරන අතර ප.ව. 1.00 වන විට පාසලේ ප්‍රධාන ශාලාවේ අසුන් ගන්නා ලෙසට දැනුම් දී සිටිමු. |

1. විවිධ ප්‍රසංගය පවත්වන්නේ කුමන සිසුන්ගේ සහභාගිත්වයෙන් ද?
   ------------------------------------------------------------------------------------------------
2. විවිධ ප්‍රසංගය පවත්වන්නේ කවදා ද ?
   ------------------------------------------------------------------------------------------------
3. එය ආරම්භ වන වේලාව කීය ද?
   ------------------------------------------------------------------------------------------------
4. එය නැරඹීමට ආරාධනා කරන්නේ කාට ද?
   ------------------------------------------------------------------------------------------------
5. රඟන රැඟුම් ප්‍රසංගය පැවැත්වෙන්නේ කොහේ ද?
   ------------------------------------------------------------------------------------------------

(ල. 2×5 =10)

**10)පහත වාක්‍ය අතීත හරවා නැවත කාලයට ලියන්න.**

1.තාත්තා බඩු ගෙන ඒමට නගරයට යයි.

----------------------------------------------------------------------------------------------------

2.ඔවුහු මල් පැළ සිටවති.

----------------------------------------------------------------------------------------------------

3. විදුහල්පතිනිය සභාව අමතයි.

----------------------------------------------------------------------------------------------------

4. තාරාවා දියේ පීනයි.

----------------------------------------------------------------------------------------------------

5.දිය ඇල්ල පහළට ගලයි.

----------------------------------------------------------------------------------------(ල. 2×5 =10)